බාලවයස්කාර දැරියක් තම සොයුරා අතින් දීර්ඝ කලක් තිස්සේ ලිංගික අපයෝජනයට ලක්වූ සිදුවීමක් මව්බිම (11/25) සහ දිවයින (11/25) වාර්තා කර තිබුණි.

මෙහිදී නිරීක්ෂණය කළ හැකි වූ කරුණු පහත පරිදි පෙළගැස්විය හැක.

1) ලිංගික අපරාධය හැඳින්වීම සඳහා මව්බිම "කෙළෙසීම" යන යෙදුම භාවිතා කර තිබුණි.

දිවයින එය අතවරයක් සහ අපයෝජනයක් ලෙසින් දක්වා තිබිණි.

කෙළෙසීම යන යෙදුම ඔස්සේ, ලිංගික අපරාධයකට මුහුණ පෑ අය (survivor) කිලිටි වී ඇති බවක්, අපවිත්‍ර වී ඇති බවක් හැඟවේ. එය ඔවුන් සමාජ ගර්හාවට, කොන් කිරීමට ලක් කළ හැකි මගකි.

2) මව්බිම පුවතෙහි "දැරියගේ අයියලා දෙන්නම කුඩ්ඩෝ" යනුවෙන් සඳහන් විය.

දිවයින පුවතේ සඳහන් වන්නේ "තදින්ම මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ" අය ලෙසිනි.

"කුඩ්ඩා" වැනි සෘණාත්මක ලේබල්ගත කිරීම්, පොදුවේ සමාජය තුළ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් පිළිබඳ කොන් කිරීමේ ආකල්පයන් ජනිත කිරීමට හේතු විය හැක.

3) මව්බිම සහ දිවයින පුවත් දෙකෙහිම දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී පළ කළ යුතුව තිබූ උපකාරක අංක සඳහන් නොවීය.

උපකාරක අංක සඳහන් කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුවකින් යුතු තවත් අයෙකුගේ ජීවිතයක් ගලවා ගැනීමට ඉඩ ලැබිය හැක.

ඒ අනුව, මේ පුවත් දෙක අතුරින් ඔබ තෝරාගන්නා පුවත කුමක්ද?

1) "මවට පියාට තග දමා තුන්වසරක් තිස්සේ නංගීව කෙලෙසූ නරුම අයියා රිමාන්ඩ්"

2) "මරුට හරස් වූ තරුණයා අතවරයට පත් තරුණිය බේරා ගනී."

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)